# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2013 සැප්තැම්බර් මස 24 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.46 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු අයි.ඒ. සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බල ශක්ති සහ වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා) |
| ගරු ජගත් අංගගේ | (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර කටයුතු අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු රේණුක දූෂ්‍යන්ත පෙරේරා | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

| | | |
|---|---|---|
| අමරසේකර, ශිරන්ත | ද සිල්වා, අනන්ද හරිශ්චන්ද්‍ර | රහුමාන්, මොහොමඩ් මුජිබර් |
| අම්ජාඩ්, එම්.එම්.එම්. | ද සිල්වා, ගාමිණී | රාජකරුණා, හර්ෂණ |
| අල්මේදා, මහේෂ් | ද සිල්වා, ජයන්ත | රාජපක්ෂ, තිලකරත්න |
| අබේරත්න, පී.ඩී. | ද සිල්වා, පියල් නිශාන්ත | රාජපක්ෂ, වරුණ දීප්ති |
| උඩවත්ත, කීර්ති | ද සිල්වා, සිරිකමල් හිලිෂියන් | රාජේන්ද්‍රන්, එස්. |
| උඳුගොඩ, ප්‍රදීප් | ද සොයිසා, විජයමුණි සුමිත් | රාම්, පංචරත්නම් |
| එල්ලාවල, ලලිත් | දේවප්‍රිය, ඉසුර | රූපසිංහ, ආනන්ද රංජිත් |
| කහටපිටිය, කිත්සිරි | නිසාම්ඩීන්, එම්. අර්ෂාද් | රොද්‍රිගු, රන්දීර් |
| කාරියවසම්, කීර්ති | පතිරණ, සරත් | ලක්තිලක, ශිරාල් |
| කාරියවසම්, ලයනල් | පියනන්ද ස්ථවිර, පූජ්‍ය තෙඹුවන | වනිගරත්න, ලලිත් |
| කුමරගුරුබරන්, එන්. | පාදුක්ක, නිරෝෂන් | වර්ණකුමාර, ලලිත් |
| කුමාර, ජගත් | පෙරේරා, තුෂාර | වරාගොඩ, රෙහෙන්සිරි |
| කුරුවිටගේ, මහින්ද | පෙරේරා, දයාකාන්ත | වැලිවත්ත, ජනක් දීපාල් |
| කොටකදෙනිය, එච්.එම්.ජී.බී. | පෙරේරා, පෝල් | විජේමාන්න, ලක්ෂ්මන් |
| කොස්තා, ජේම්ස් ප්‍රිම්ලස් | පෙරේරා, ප්‍රදීප් | විජේරත්න, උදේන |
| කෝරළගේ, යසපාල | පෙරේරා, මෙරිල් | විජයරත්න, මොරිස් |
| ගමගේ, සලෝචන | පෙරේරා, ශ්‍රීනාත් | විජේසුන්දර, ශාලිත |
| ගුණරත්න, උපාලි | ප්‍රනාන්දු, කිත්සිරි | විජේසේකර, රවී |
| ගුණවර්ධන මැතිනිය, කෝකිලා හර්ශනී | ප්‍රනාන්දු මැතිනිය, රෝස් | සකළසූරිය මැතිනිය, චන්ද්‍රිකා ගුණවර්ධන |
| ගුණසේකර, විකුම් | ප්‍රියන්ත, විජිත් | සරණලාල්, චන්ද්‍රසෝම යූ.ජී. |
| චන්ද්‍රභානු, අධිකාරම්ගේ | බෙත්මගේ, හෙක්ටර් | සිරිවර්ධන මැතිනිය, සන්ධ්‍යා |
| චන්ද්‍රරත්න, නිමල් | මතුගමගේ, සුගත් | සිල්වා, අමල් |
| ජයකොඩි, චන්දන | මල්ලව, නෙලුක් | සුමනසේකර, සරත් කුමාර |
| ජයකොඩි, සිසිර | මවුජුඩ්, අජ්මාල් | සූරියබණ්ඩාර, ජානක |
| ජයතිස්ස, නලින්ද | මංචනායක, කිත්සිරි | සෙනෙවිරත්න, රොජර් |
| ජයනාත්, ගුණසිරි | මැන්දිස්, සුමිත් ලාල් | ෆවුසි එම්. නවුසර් |
| ජයසිංහ, ලයනල් | යූසුෆ්, ඒ.එම්. | ෆායිස්, මොහොමඩ් |
| තිලකසිරි, ගාමිණී | රහීම්, එම්.එස්.එම්. | |

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු නිමල් ලාන්සා | (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු :**

| | | |
|---|---|---|
| තිලකරත්න, හෂාන් | කුලරත්න, ලාල් | ජයවර්ධන, නිහාල් |

කුරුප්පු, කාමල් රාජපක්ෂ, දිලිප් කුමාර
ද සිල්වා, සේනක දමයන්ත ලංකාතිලක මැතිනිය, අශෝකා
පීරිස්, නිමල් ආර්. ෆයිරුස්, මොහොමඩ්
පෙරේරා, අ. ශ්‍රීනාත් ම.

## 01. සභාපතිවරයාගේ නිවේදනය :

*"2013 අංක..... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය දෙවනවර කියැවීමේ වැඩ කටයුතු ඊළඟ සභා රැස්වීම් දිනයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා පිළිගැන්වීම :

2013.09.03 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 03. නොපැමිණ සිටීමේ අවසරය :

*"සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට මාස තුනක් රැස්වීම්වලට නොපැමිණ සිටීමේ අවසර දිය යුතු යැයි "* සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත විය.

***පූ.භා. 10.25 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.10 ට යළිත් රැස් විය.***

## 04. 2013 පරිපූරක අස්තමේන්තුව - 01:

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"2013 පරිපූරක ඇස්තමේන්තුව 01[1] (පුනරාවර්තන වියදම් රු.624,746,000/-, මූලධන වියදම් රු.793,000,000/- මුළු ප්‍රතිපාදනය රු.1,417,746,000/-) අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. 2013 පරිපූරක අස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය:

ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2013 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව 01 සඳහා අවශ්‍ය රුපියල් එකසිය එක් කෝටි හැත්තෑ හත් ලක්ෂ හතලිස් හය දාහයක්(රු.1,417,746,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2013 අංක...... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

## 06. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : පළාත් පාසල් නඩත්තුව සඳහා වෙනත් ක්‍රමවලින් ලැබෙන මුදල් විධිමත්ව ලබා ගැනීමේ ක්‍රමයක් ඇති කිරීම

[1] 2013.09.24 දින නිල වාර්තාව බලන්න.

සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද, පහත සඳහන් යෝජනාව යූ.ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය. එහෙත් රට තුළ මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව අයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අයවැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යාංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරීන් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදී සිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල්වල අඩුපාඩු සකස් කර ගන්නා බව නොරහසකි. අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා 11.58 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ඒ.එම්. යූසුෆ් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීමේ යෝජනාව :

සුනිල් ජයමිණි - ගරු සභා නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව පළාත් සභාව, අ.භා. 12.47 ට, 2013 ඔක්තෝබර් මස 08 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.09.24
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/24
Minuts 2013.09.24 - Hansard Section